# ප්‍රසම්පාදන දැන්වීම - 2025
# මොනරාගල ප්‍රාදේශීය සභාව

මොනරාගල ප්‍රාදේශීය සභාව සතු පහත උපලේඛනයෙහි සඳහන් දේපල 2025.01.01 දින සිට 2025.12.31 දක්වා වසරක කාලයකට අදාළව බදු දීම සඳහා උනන්දුවක් දක්වන ටෙන්ඩර් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා පහත කොන්දේසිවලට යටත්ව උප ලේඛණයෙහි සඳහන් ගාස්තු ගෙවීමෙන් අනතුරුව ටෙන්ඩර් අයදුම්පත් මොනරාගල ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත හැක.

1. ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගැනීම අනන්‍යතාවය තහවුරු කරන ලේඛනයක් ඉදිරිපත් කිරීම සිදු කළ යුතු අතර, අසාධු ලේඛනගත අයට ටෙන්ඩර් ඉල්ලුම්පත් නිකුත් කරනු නොලැබේ.

2. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර 2024.09.26 දින සිට 2024.10.16 දින තෙක් සතියේ වැඩ කරන දිනවල කාර්යාල වේලාව තුලදී එනම් පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

3. එම ටෙන්ඩර් අයදුම්පත් පිටපත් දෙකකින් නිකුත් කරනු ලබන අතර, මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන් වශයෙන් ලිපි කවර දෙකක දමා මුද්‍රා තබා එම ඉල්ලුම්පත් බහාලු කවර දෙකම විශාල ප්‍රමාණයේ එක ලියුම් කවරයක දමා මුද්‍රා තබා **"සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මොනරාගල"** යන ලිපිනයට නියමිත දින, නියමිත වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පැමිණ කාර්යාලයේ සභා ලේකම්ගේ නිළ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. එම අවස්ථාවේ එම ස්ථානයේ තබා ඇති අත්සන් ලේඛනයේ ඔබ විසින් ටෙන්ඩර්පත් යොමු කළ බවට අත්සන් තැබීම අනිවාර්ය වේ.

   තවද ඔබ විසින් ටෙන්ඩර් ඉල්ලීමේ අයදුම්පත් ලබා ගන්නා අවස්ථාවේ ලියකියවිලි ගාස්තුව ගෙවා ලදුපතක් ලබාගත යුතු අතර, ටෙන්ඩර් අයදුම්පත් ලබාගන්නා හෝ ඉදිරිපත් කරන අවස්ථාවේ දී ලංසු ආරක්ෂණ ඇප තැන්පත් මුදල ගෙවා ලබා ගත් ලදුපත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග අමුණා ඉදිරිපත් කර තිබීම අනිවාර්ය වේ.

**ලංසු ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්**

තමන් විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු පහත දක්වා ඇති උපදෙස් අනුව නිසි පරිදි සකස් කොට, අත්සන් කර, මුද්‍රා තබා, මුල් පිටපත සහ දෙවන පිටපත වෙන වෙනම වූ කවරවල බහා ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

( අ ) අංක 1 කවරය ( ලංසු ඉල්ලුම් පත්‍රයේ මුල් පිටපත )

මෙම කවරය නිසි පරිදි මුද්‍රා තැබිය යුතු වන අතර, එහි මුහුණතෙහි වම් පස ඉහළ කෙලවරේ ප්‍රාදේශීය සභාවට අයත් බදු ගැනීමට අදහස් කරන දේපලෙහි විස්තරය උප ලේඛණයට අනුව නිවැරදිව සඳහන් කළ යුතුය. මෙම කවරය තුළ පහත ලේඛණ අඩංගු විය යුතුය.

1. ඉදිරිපත් කරන ලංසුව දැක්වෙන ලංසු ඉල්ලුම් පත්‍රය.
2. ලංසු සුරක්ෂණ ඇපය තැන්පත් කළ ලදුපතේ මුල් පිටපත හෝ බැංකු අණකරයේ මුල් පිටපත.
3. ඉල්ලුම්කරු විසින් ම සහතික කරන ලද පහත සඳහන් ලේඛනවල, එනම්

( I ) ලංසු ඉල්ලුම්පත්‍රය මිල දී ගැනීමේදී ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරන ලද ලදු පතෙහි ඡායා පිටපත.

( ii ) ජාතික හැඳුනුම්පතෙහි දෙපැත්තේ ඡායා පිටපතක්.

( iii ) ස්ථිර ලිපිනය තහවුරු කරන ලේඛණය. ( ඉල්ලුම්කරුගේ නමින් නිකුත් කළ ජල/විදුලි/දුරකථන බිල්පත හෝ ග්‍රාම නිලධාරි සහතිකය )

( iv ) ලංසු ඉල්ලුම්කරු සමාගමක් වන විට සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපත.

**අංක 02 කවරය (( ලංසු ඉල්ලුම් පත්‍රයේ දෙවන පිටපත )**

ලංසු ඉල්ලුම් පත්‍රයේ දෙවන පිටපත සමඟ ලංසු ඉල්ලුම් පත්‍ර යේ මුල් පිටපතට ඇතුළත් කරන ලද සියළුම ලේඛණ වල සහතික කරන ලද අනු පිටපත් දෙවන පිටපත බහාලන කවරයේද ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙම කවරය නිසි පරිදි මුද්‍රා තැබිය යුතු අතර එහි මුහුණතෙහි වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන දේපළෙහි නම හා දෙවන පිටපත යනුවෙන් පැහැදැළිව සටහන් කරනු ලැබිය යුතුය.

---

4. ඉල්ලුම්පත් බහාලන විශාල කවරයේ වම් පස ඉහල කෙළවරේ පැහැදිලිව පෙනෙන සේ බදු ගැනීමට බලාපොරොත්තු වන දේපලෙහි නම හෝ කඩ කාමර අංකය පමණක් සඳහන් කල යුතු අතර, ප්‍රමාදව ලැබෙන හා තැපෑලේදී සිදුවන අස්ථානගතවීම් සම්බන්ධව මොනරාගල ප්‍රාදේශීය සභාව කිසිදු අයුරකින් වග කියනු නොලැබේ.

5. 2024.11.17 වන දින පෙ.ව. 11.00 දක්වා ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගනු ලබන අතර, 2024.11.17 දින පෙ.ව. 11.15 ට ටෙන්ඩර් ඉල්ලුම්පත් විවෘත කිරීම සිදු කරනු ලැබේ. එම අවස්ථාවට ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අය හෝ ඔවුන් විසින් ලිඛිතව බලය පැවරූ නියෝජිතයින්ට පමණක් සහභාගි විය හැකිය.

6. ටෙන්ඩර් තීන්දු කිරීමෙන් පසුව එම ටෙන්ඩරය අත්හැර දමන ටෙන්ඩර්කරුවන්ගේ ලංසු ආරක්ෂණ ඇප තැන්පත් මුදල් හෝ බැංකු අණකරය සභා සන්තක කරනු ලබන අතර, ඔවුන්ගේ නම් අසාධු ලේඛන ගත කරනු ලැබේ.

7. සභා ලේකම්ගේ අත්සන සහ ආයතනයේ නිල මුද්‍රාව සහිත ටෙන්ඩර් අයදුම්පත් පමණක් ලබාගෙන ඔබ විසින් ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොවන ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ලංසු ආරක්ෂණ ඇප තැන්පත් මුදල හා ලියකියවිලි ගාස්තු ගෙවා ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගනු ලැබුවද, එම අයදුම්පත් නිසි පරිදි ඉදිරිපත් නොකලහොත් එම මුදල් ආපසු ගෙවනු නොලැබේ. රජය විසින් අවස්ථානුකූලව පනවනු ලබන බදු හා වෙනත් ගෙවීම් ටෙන්ඩර්කරු විසින් ගෙවීමට බැඳී සිටිය යුතුය. මෙම දේපල සඳහා ටෙන්ඩර් පිළිගත් බව දැනුම් දී දින 07 ක් ඇතුලත මාස 03ක ඇප තැන්පත් මුදල් ගෙවා අවසන් කිරීමෙන් පසු ගිවිසුම් ගතවිය හැකි අතර අනතුරුව දේපළට පිවිසීමට අවසරය හා යතුරු භාරදෙනු ඇත.

9. ඉහත සඳහන් කළ පරිදි දින 07 ක් ඇතුළත අදාල මාස 03 ඇප තැන්පත් මුදල් තැන්පත් නොකලහොත් ඔබ මෙම ටෙන්ඩරය අතහැර දැමුවා සේ සලකා ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ.

10. මොනම හේතුවක් නිසා හෝ එකම දේපළ සඳහා එක් අයදුම්කරුවෙකුට ටෙන්ඩර් අයදුම්පත් 02ක් නිකුත් නොකරන අතර, භාරදීමද නොකළ යුතුය.

11. 2013.06.28 දිනැති අංක 1816/43 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි 19 වන කොටස " මස් විකිණීම" මාතෘකාව යටතේ දක්වා ඇති කොන්දේසි හා නියමයන් යටතේ (ගව/එළු) මස් වෙළඳසැල් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

12. ගෝ ඝාතක ආඥා පනතේ නියමයන් යටතේ විධිමත් බල පත්‍රයක් ලබාගෙන ඇති ගෝ ඝාතකාගාරයක දී මරණු ලැබූ මස් වෙළඳසැල දක්වා ප්‍රවාහනය කිරීමට අදාළ සියලුම බලපත්‍ර ඇතුළු අවශ්‍ය නීතිමය අවසරය බදු ගැනුම්කරු විසින් ලබාගත යුතු අතර, මොනරාගල ප්‍රාදේශීය බල ප්‍රදේශයෙන් පිටත එවැනි බලපත්‍ර ලබා ගැනීම් හෝ අවසර ලබා ගැනීම් සඳහා ප්‍රාදේශීය සභාවේ කිසිදු මැදිහත්වීමක් සිදු කරනු නොලැබේ.ප්‍රවාහනයේ දී අනුගමනය කළයුතු සියලුම නීතිමය අවශ්‍යතා අනුගමනය කිරීමට බදු ගැනුම්කරු කටයුතු කලයුතුය.

13. ඔබ විසින් ටෙන්ඩර් මඟින් ලබා ගනු ලබන දේපළට අදාළව මාසිකව ගෙවිය යුතු ජල, විදුලි, දුරකතන ආදී ගාස්තු හා වැසිකිළි සම්බන්ධව පවතින ගලි ඉවත් කිරීම් බදුකරු විසින්ම සිදු කළ යුතු අතර, අයදුම් පත්‍රය සමඟ ලබා දී ඇති කෙටුම්පත් ගිවිසුමේ සඳහන් අනෙකුත් සියලු කොන්දේසි අදාළ වන බව දැනුම් දෙමු.

14. ලංසු ආරක්ෂණ ඇප තැන්පත් මුදල හා ලියකියවිලි ගාස්තු සඳහා ගෙවීම් කිරීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

15. සාර්ථක මිල ගණන් ඉදිරිපත් කර ඇති පළමු ලංසුකරු වෙත අදාළ ටෙන්ඩරය පිරිනැමීමෙන් පසු එම ටෙන්ඩරය අත්හැරිය හොත් දෙවන සාර්ථක ලංසුකරු පිළිබඳව සළකා බලන අතර ඔහු එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළ හොත් ඉන් පසු අනෙකුත් ටෙන්ඩර් නොසලකා අදාල දේපළ නැවත ටෙන්ඩර් කිරීම සිදු කරනු ලැබේ.

16. කිසියම් ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ඒ සම්බන්ධව අවසන් තීරණ ගැනීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර, ටෙන්ඩරය පිළිබඳව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය නිශ්චිත හා අවසාන තීරණය වනු ඇත. තවද ප්‍රසම්පාදන ක්‍රියාවළියට අදාළ දින වකවානු මෙපරිදිම වන අතර නොවැළැක්විය හැකි හා අත්‍යාවශ්‍ය හේතුවක් මත එම දින හෝ වේලාවන් වෙනස් කිරීමට සිදුවුවහොත් ප්‍රසම්පාදන කමිටුව සියළු අයදුම්කරුවන් වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

17. මේ පිළිබඳව වැඩි විස්තර කාර්යාල වේලාව තුලදී කාර්යාලයට පැමිණ හෝ දුරකථන අංක 055-2276175 මගින් මොනරාගල ප්‍රාදේශීය සභාවෙන් විමසා දැනගත හැකිය.